# ශ්‍රී ලංකා ජනාධිපති
## இலங்கை சனாதிபதி
## President of Sri Lanka

### පණිවුඩය

පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමේ සහ පාරිසරික ගැටලු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කිරීමේ අරමුණෙන් සෑම වසරකම ජුනි 5 වැනි දිනට යෙදෙන ජගත් පරිසර දිනය නිමිත්තෙන් මේ පණිවිඩය නිකුත් කරන්නේ සතුටිනි.

මිනිසා ඇතුළු සියලුම ප්‍රාණීන් හා පරිසරය අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. අතීතයේ පටන් ශ්‍රී ලාංකීය ප්‍රජාව පරිසරය සමග පවත්වාගෙන ආ ගැඹුරු සබැඳියාව අපගේ ජන ජීවිතය පෝෂණය කිරීමට හේතු විය. එසේ පරිසරය සමග සහජීවී ඇවතුම් පැවතුම් ඇතිව ගොඩනැගුණු ජාතියක අනාගත පරපුරට පරිසරය පිළිබඳ අපගේ අතීත ඥාන සම්භාරය මෙන්ම වත්මන් පාරිසරික ගැටලු පිළිබඳ අවබෝධයක් ලබාදීමේ අවශ්‍යතාව අද අන් කවරදාටත් වඩා දැනේ.

ගංවතුර, නායයාම්, ග්ලැසියර දියවීම, වායු දූෂණය, වායු ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම සහ පාරිසරික විපර්යාසය වැනි අනේක විධ පාරිසරික ගැටළු මානව ක්‍රියාකාරීත්වයේ ඍජු ප්‍රතිඵලයකි. පරිසර විනාශය මිනිසාගේ අනාගත පැවැත්මට බලවත් අභියෝගයක් වනු නිසැකය. කොවිඩ් 19 වසගංතය නිසා උද්ගතව ඇති පෙර නොවූ විරූ ගෝලීය අර්බුදය පරිසර සංරක්ෂණයේ වැදගත්කම මිනිසාට නිශ්චිතව අවබෝධ කරවන අවස්ථාවක් ලෙස මම දකිමි.

තිරසර පාරිසරික උපායමාර්ගයක අවශ්‍යතාව "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් හඳුනාගනු ලැබීය. භූමි කළමනාකරණය, ජෛව විවිධත්වය සුරැකීම, ජාතික වන ගහනය වැඩි කිරීම, විද්‍යාත්මක කසළ කළමනාකරණය සහ පරිසර හිතකාමී ජනාවාස ආදී එහි සඳහන් පරිසර සංරක්ෂණ ප්‍රවේශයන් යථාර්ථයක් බවට පත්කිරීමට ඉදිරි කාලය තුළ පියවර ගනු ලැබේ.

"ජෛව විවිධත්වය - සොබා දහමට ඉඩක්" යන තේමාව යටතේ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජගත් පරිසර දින සැමරුම් සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා යි පතමි.

ගෝඨාභය රාජපක්ෂ

2020 ජුනි මස 04 වන දින